*පූජ්‍ය ගංගොඩවිල සෝම ස්වාමින්වහන්සේ අපවත්වී දෙසැම්බර් 12 වෙනි දිනට වසර නවයක් සම්පූර්ණ වේ. මේ ලිපිය ඒ නිමිත්තෙනි.*

# කේන්ද්‍රය හෙළිකරන ගංගොඩවිල සෝම හිමියන්ගේ මරණයේ රහස්



ශ්‍රීලාල් සෙනෙවිරත්න

නුගේගොඩ ගංගොඩවිල පදිංචි යුවළකගේ පවුලේ පළමු පිරිමි දරුවා ලෙෂ 1948 අප්‍රේල් 24 සවස 04.24ට කොළඹ දී උපත ලැබූ සෝම හිමියන්ගේ ගිහි නම වීරතුංග ආරච්චිලාගේ දොන් සෝමරත්නය. බාල සහෝදරයන් දෙදෙනෙකු සහ සහෝදරියන් දෙදෙනෙකු සිටි සෝමරත්න කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ 6 වන ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලැබ එතැන් සිට ඉසිපතන විද්‍යාලයට ඇතුළත්ව අධ්‍යාපනය ලබා ඇත.

තමන් නොකළ වරදකට ගුරුවරයෙකුගෙන් දඬුවම් විඳින්නට සිදුවීමෙන් පසු මේ දරුවා ආනන්ද ශාස්ත්‍රාලයට පය ගැසීම පවා ප්‍රතික්ශේප කිරීම මේ පාසල් මාරුවට හේතු වී ඇත. වජිරාරාමයේ දහම් පාසල් අධ්‍යාපනයද ලද සෝමරත්නට නුවරඑළියේ විමලතිස්ස නම් හාමුදුරුනමක ඇසුර ලැබීමෙන් පසු පැවිදිවීමේ අශාවක් ඇතිවී ඇතත් දෙමව්පියන්ගෙන් ඊට ඉඩ ලැබී නැත.

සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව සුළු ව්‍යාපාරිකයෙකු ලෙස ජීවිකාව ගෙනයන අතර වැඩිදුර ධර්ම අධ්‍යාපනයට යොමුවී ඇත. මහරගම වජිරඥාන ධර්මායතනයේ ත්‍රිපිටක සජ්ජායනයකට නොකඩවා සහභාගි වෙමින් සිටින අතර තමන්ට කිසියම් විශේෂිත ධර්ම ඥානයක් ලැබෙමින් පවතින බව එහිදී වැටහී ඇත.

වයස 20 වන විට ක්‍රියාකාරී තරුණ උපාසක මහතකු බවට පත්ව ඇති සෝමරත්න පොහොය දිනවල ධර්මානුශාසනා පැවැත්වීමද අනිවාර්ය අංගයක් බවට පත්ව තිබේ.

සෝමරත්න තරුණයා ගංගොඩවිල සෝම නමින් පැවිදි දිවියට ඇතුළත්ව ඇත්තේ 1974 සැප්තැම්බර් 20වෙනිදාය. 1976 මැයි 26 උපසම්පදාව ලබා ඇත. පසුව මහරගම ධර්මායතනයේ වාසය කර ඇති සෝම හිමියෝ කලක් අම්පාරේ මහඔය ප්‍රදේශයේ දුෂ්කර ආරණ්‍ය දිවියක්ද ගතකර ඇත. එම කාලයේ තමන් සම්බන්ධයෙන් පැතිරුණ කටකතා හේතුවෙන් බලවත් චිත්ත පීඩාවට පත් සෝම හිමියෝ එය ජයගෙන ඇත්තේ බුද්ධානුස්මෘති භාවනාව වැඩීමෙනි. ආරණ්‍ය ගතව වාසය කරන කාලයේ දින 35ක ධර්ම චාරිකාවක සෝම හිමියෝ නිරතව ඇත්තේ පා ගමනිනි. දානය ලබාගෙන ඇත්තේ පිඬු සිඟමනෙනි.

ඔස්ට්‍රේලියාවේ පදිංචි ශ්‍රීලාංකේය යුවළකගේ ආරාධනයෙන් 1989 වෙසක් පසොළොස්වක පෝය දිනට පසුදින සෝම හිමියෝ ඕස්ට්‍රේලියාවට වැඩම කළහ. කලක් නිවෙසක් තාවකාලික විහාරස්ථානයක් ලෙස භාවිත කළ සෝම හිමියෝ 1994 මැයි මාසය වන විට මෙල්බර්න් නුවර නව විහාරස්ථානයක් ඉදිකරගැනීමට සමත්වූහ.

පසුව ලංකාවටද නිතර වැඩම කළ විචිත්‍ර ධර්ම කථික භික්ෂුවක වූ සෝම හිමියන්ගේ ධර්ම දේශනාවලදී නිරන්තරයෙන්ම බෞද්ධ පිළිවෙත් තුළට වැද ඇති ජනප්‍රිය මිත්‍යා මතවලට පහර එල්ල වීම සුවිශේෂී ලක්ෂණයකි.

විද්‍යුත් මාධ්‍යයේ ප්‍රමුඛස්ථානයක් හිමිකරගෙන සිටි ධර්ම කථික සෝම හිමියෝ තමන් ජනාධිපතිවරණයට තරඟ කරන බවට 2002 වසර අගදී ප්‍රකාශයක් කිරීම හේතුවෙන් ජීවිත අවදානමකට මුහුණ පා ඇත. 2002 දෙසැම්බර් 25දා සිය අරමුණු ජයගැනීම වෙනුවෙන් 'ජන විජය' නමින් පදනමක් අරඹා ඇත.

අනතුරුව ජීවිතයට ඇතිවිය හැකි තර්ජණවලින් ආරක්ෂාවීමට සෝම හිමියන්ට පෞද්ගලික නිවාසයක රැඳී සිටින්නත් ධර්ම දේශනාවලට යන අවස්ථාවල ආරක්ෂාවට පිරිසක් රැගෙන යාමටත් සිදුවී ඇත.

2003 ඔක්තෝබර් 11 දින සෝම හිමියෝ රුසියාව බලා පිටත්ව ඇත්තේ ආචාර්ය උපාධියක් ලබාගැනීමටය. ඒ වන විට දියවැඩියා සහ කොලෙස්ටරෝල් අසනීප තත්ත්වයකින් එහිමියෝ පීඩා විඳිමින් සිට ඇත. ගුවන් යානයේදී පපුවේ දැවිල්ලක් වැනි රෝගී තත්ත්වයක් උත්සන්නවීම හේතුවෙන් රුසියාවේ ගුවන් තොටුපොලින් එහිමියෝ කෙලින්ම ගෙන ගොස් ඇත්තේ රෝහලකටය. එතැන් සිට දිගටම අසනීප තත්ත්වයෙන් පෙළුණු උන්වහන්සේ දෙසැම්බර් 12 දින පෙරවරු 8.00 ට සෝම හිමියෝ රුසියාවේදී

ජන්මියෙකුගේ ආයු බලය විමසා බැලීමේදී මූලිකව කේන්ද්‍රයේ 8වෙනි භාවයේද, දෙවනුව 1,2,3 සහ 7යන භාවයන්ගේද, එම භාව රාශි අධිපතියන්ගේද බල දුබලතා විමසා බැලේ. එකී භාව කාරකත්ව සහ ග්‍රහ කාරකත්ව අනුව යමෙකුගේ මරණය කවරාකාරයෙන් සිදුවන්නේද යන්න ජ්‍යෝතිෂ සිද්ධාන්ත අනුව අනාවරණය කරගත හැක. ඉමහත් ආන්දෝලනාත්මක මරණයකට උරුමකම් කී පූජ්‍ය ගංගොඩවිල සෝම හිමියන්ගේ කේන්ද්‍රයේ මරණය සම්බන්ධයෙන් ප්‍රකාශිත තත්ත්ව මොනවාදැයි දැන් අපි විමසා බලමු.

පුද්ගලයකුගේ ආයුෂ සහ මරණය සිදුවන ආකාරය මූලිකව විමසා බලන්නේ කේන්ද්‍රයේ 8වෙනි භාවයෙන් වන බැවින් අටවැන්න මාරක ස්ථානය වශයෙන්ද නම් කෙරේ. 8 අධිපති, එහි පතිත ග්‍රහයන් සහ 8වෙනි භාවයට වැටී ඇති ග්‍රහ දෘෂ්ඨි විමසා බැලීමෙන් කේන්ද්‍ර හිමි අයගේ මරණය පිළිබඳ බොහෝ තොරතුරු අනාවරණය කර ගත හැකිය.

කන්‍යා ලග්නයෙන් උපන් සෝම හිමියන්ගේ 8 වෙනි භාවයට අයත්වන රාශිය මේෂ රාශියයි. එහි අධිපතියා කුජය. මාරකස්ථාන වන 8 අධිපති කුජ උපතේදී 11වෙනි භාවයේ සෙනසුරු සමඟ තැන්පත්ව සිටී. කුජ සහ ශනි ග්‍රහ සංයෝගය නරකට පිහිටියහොත් ඒ තැනැත්තා රුධිර පීඩන රෝගියෙක් (බ්ලඩ් ප්‍රෙෂර්) වන බව ජ්‍යෝතිෂයේ සඳහන්වේ. හොඳට පිහිටීම යනුවෙන් අදහස් කරන්නේ ඒ ග්‍රහයන් කේන්ද්‍රහිමියාට සුබ ග්‍රහයන්වී, කේන්ද්‍රයේ සුබ ස්ථානවල, සුබ දෘෂ්ඨි ලැබ, උච්ච, ස්ව, හෝ මිතුරු තත්ත්වයෙන් සිටීමය. නරකට පිහිටීම යනු එහි අනෙක් පැත්තය. එනම් එකී ග්‍රහයන් කේන්ද්‍රහිමියාට අසුබ ග්‍රහයන්වී, අසුබ ස්ථානවල, අසුබ දෘෂ්ඨි ලැබ, නීච, සතුරු, මූඪ ආදී තත්ත්වයකින් සිටීමය.

කුජ මෙන්ම සෙනසුරුද නෛසර්ගික පාපී ග්‍රහයන්ය. කුජ විශේෂයෙන්ම කන්‍යා ලග්න හිමියන්ට පාපී ග්‍රහයෙකි. 3 සහ 8 යන මාරකස්ථානාධිපති බැවින් සුබ ඵල දෙන්නේ නොවේ. එවන් කුජ සිටින්නේද නීච තත්ත්වයෙනි. කුජට නෛසර්ගික සුබයකු වන බුධගෙන් දෘෂ්ටියක් ලැබී ඇතත් බුධ තැන්පත්ව සිටින්නේ මාරක ස්ථානයේ බැවින් ඒ දෘෂ්ඨියෙන්ද සුබ පල හිමි නොවේ. එබැවින් මේ කේන්ද්‍රයේ කුජගේ පිහිටීම ක්‍රියාත්මක වන්නේ නරකටය.

කුජ හා සංයෝගව සිටින සෙනසුරු කේන්ද්‍රයේ 6වැන්න අධිපතියාය. දුෂ්ඨ ත්‍රිකයට අයත් 6වැන්න හැඳින්වෙන තවත් නමක් වන්නේ 'රෝගස්ථානය'යි. සෙනසුරු සැළකෙන්නේ කිසිදු හොඳක් බලාපොරොත්තු විය නොහැකි ග්‍රහයෙකු ලෙසිනි. රෝග ස්ථානයේ අධිපතියාගෙන් රෝග හැර අන් කවරක් ලැබෙනු ඇතිද? සෙනසුරුගෙන් ලැබෙන්නේ කල් අල්ලා සිටින, ඇදි ඇදී යන රෝගය. එබැවින් මේ කේන්ද්‍රයේ කුජ-ශනි ග්‍රහ සංයෝගය නරකට පිහිටා තිබේ. එසේ නම් ජ්‍යෝතිෂය අනුව එහි ඵලය කේන්ද්‍රයේ හිමිකරුට ලැබිය යුතුව ඇත.

**ජන්මපත්‍රය**




විශේෂඥ අධිකරණ වෛද්‍යවරුන්ද ඇතුළත්ව සෝම හිමියන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකළ එකොළොස්දෙනෙකුගෙන් යුත් වෛද්‍ය කණ්ඩායම අධිකරණයට ඉදිරිපත් කළ වාර්තාව මගින් අනාවරණය කර තිබුණේ සෝම හිමියන්ට අධික රුධිර පීඩනය මෙන්ම දියවැඩියා රෝගයද තදබල ලෙස තිබුණු බවය. 'සෝම ස්වාමින්වහන්සේගේ අවහිරතාව ඇතිවෙලා තිබුණ කිරීටක ධමනියේ තැන්පත්වෙලා තිබුණ මේද ස්ථරය දිහා බැලුවම අපට පෙනුණේ ඒ සඳහා වසර දහයක පමණවත් කාලයක් ගත විය හැකි බවයි. ලේ කැටියක් සමඟින් කිරීටක ධමනිය සම්පූර්ණයෙන්ම අවහිර වෙලා තිබුණේ. සෝම හිමියන්ට අධික රුධිර පීඩනය තිබුණ බවට සාක්ෂි තිබුණා. මොකද හෘදය වස්තුව ඉදිමිලා තිබුණා. වම් තුන්දිකාව දරුණු ලෙස ඉදිමිලා තිබුණා....'

පශ්චාත් මරණ අධිකරණ වෛද්‍ය පරීක්ෂණය පැවැත්වූ කණ්ඩායමේ සාමාජික මහාචාර්ය චන්ද්‍රසිරි නිරිඇල්ල මහතා 2004 ජනවාරි 11 'රාවය' පුවත්පතට දී තිබුණු සම්මුඛ සාකච්ඡාවේ කරුණු දක්වා තිබුණේ එසේය. 'ගරු සෝම හිමියෝ ගතවූ අවුරුදු දහය තිස්සේ දෙවෙනි ගණයේ උග්‍ර දියවැඩියාවෙන් පෙළී ඇත.' රුසියාවේ ශ්‍රී ලංකා තානාපති යූ.බී. විජේකෝන් මහතා සෝම හිමියන්ගේ මරණය සම්බන්ධයෙන් විදෙස් අමාත්‍යාංශය වෙත එවන ලද වාර්තාවේ එසේ දැක්වේ. මාරකස්ථානාධිපති සමඟ සංයෝග වූ සෙනසුරුගේ කාරකත්වය සෝම හිමියන්ගේ මරණයට බලපා තිබූ අන්දම නූතන වෛද්‍ය විද්‍යාව මගින් තහවුරු කෙරුණු අයුරු මේ අනුව පැහැදිලිය.

එකොළොස්වැන්නේ යෙදෙන ද්වි ග්‍රහ සංයෝගයේ එක් ග්‍රහයෙක් (කුජ) මාරකස්ථානාධිපතිය. මරණය නිවේදනය කරන්නාය. අනෙක් ග්‍රහයා ලෙඩටටද, දුකටද අධිපති සෙනසුරුය. ග්‍රහ යෝගය යෙදී ඇත්තේ මරණය ගැන නිවේදනය වන තවත් ස්ථානයක් වන 11වන භාවයේය. මේ කරුණු ගැලපූ විට කේන්ද්‍රය හිමිකරුගේ මරණය කල් අල්ලා සිටින රෝගයක් හේතුවෙන් සිදුවිය හැකි බව පෙනී යයි. ග්‍රහ යෝගයේ බලවත් ග්‍රහයා සෙනසුරු බැවින් මරණය සිදුවන්නේ සෙනසුරුගේ කාරකත්වයේ ආකාරයට එනම් දුක් විඳ ඇදි ඇදී බවද පෙනී යයි. සෙනසුරු තැන්පත්ව ඇති රාශිය කටකය බැවින් මරණය පිටස්තර ස්ථානයකදී සිදුවන බවද ජ්‍යෝතිෂය කියයි. කටකය ජල රාශියකි. එබැවින් මරණය සිදුවන පසුබිමට ජලයේ සම්බන්ධයක් ඇති බවද පෙන්වයි. මරණය පිළිබඳ මේ කරුණු කේන්ද්‍ර පරීක්ෂාවකදී මරණය සිදුවීමට පෙර පැවසීම ජ්‍යෝතිෂවේදියෙකුට අපහසු දෙයක් නොවේ. එහෙත් බටහිර නවීන විද්‍යාව මගින් මේ කරුණු අනාවරණය වන්නේ මරණ පරීක්ෂණයකදීය. සෝම හිමියන්ගේ කේන්ද්‍රයේ මරණය පිළිබඳ දැක්වෙන කරුණු පශ්චාත් මරණ පරීක්ෂණයේදී ඒ ආකාරයෙන්ම වාගේ අනාවරණය කර තිබිණ. '...මෙහි කාලගුණයද බෙහෙවින් අහිතකරය. තද හිමපතනයක් පවත්නා අතර උෂ්ණත්වය සෘණ සෙල්සියෙස් මට්ටමට පත්ව තිබේ. සෝම හිමියන්ගේ අභාවය සිදුවූයේ මොස්කව් හි සිට කිලෝ මීටර් 750ක් දුරින් පිහිටි ශාන්ත පීටර්ස්බර්ග් නුවරදීය. එහි කාලගුණික තත්ත්වය වඩාත් නරකය...'

රුසියාවේ ශ්‍රී ලංකා තානාපති විජේකෝන් මහතාගේ වාර්තාවේ එක් තැනක එසේ දැක්වේ. කටක රාශියේ ගුණ ප්‍රකට කරමින් මරණය සිදුවූ පසුබිම ජලය හා පැවැති සම්බන්ධය එමගින් මොනවට අනාවරණය වේ.

41 වන පිටට










